69	තඹුත්තේගම		87																	87
70	තංගල්ල	15	41	1		1	3		3	1	2			5			3			75
71	ත්‍රිකුණාමලය	7	42	2		7					2		23							83
72	වවුනියාව	18	60	1		1											2			82
73	වාලච්චේනය	2	343			1														346
74	වරකපොල	12	19	1		2				1	3						2			40
75	වැලිමඩ	8	39	1		2			1		9	3		3		2			5	73
76	වලස්මුල්ල	25	64			8			3		4		1							105
77	වාරියපොල	14	25						3		18			2			2	1		65
78	වැල්ලවාය	16	62						10								3			91
79	**දෙහිඅත්තකණ්ඩිය**	12	20			4					1	2				7	1		4	51
80	**සියඹලාණ්ඩුව**		31						6		2					14		1	4	58
81	බොරැල්ල										19		74							93
82	**ගලගෙදර**		19													2				21
83	වත්තල		20						4		1		15	1					1	42
84	හෙට්ටිපොල		52								1			1		4				58
	එකතුව	1440	4688	97	5	249	53	37	202	61	265	70	411	162	28	115	75	16	101	8075

2021 වසරේ අවසන් කරන ලද නඩු වරගකරණය

අනු අංකය	මධ්‍යස්ථානය	දික්කසාද	නඩත්තු	ඉඩම්	බෙදුම්	මුදල්	මහාධිකරණ නඩු	අභියාචනාධිකරණ නඩු	අනතුරු	ඇප	වෙනත්	ළමා අයිතිවාසිකම්	කම්කරු	අපරාධ	ශ්‍රේෂ්ඨාධිකරණ නඩු	අපරාධ විත්දිත	විශේෂ	භාරකාරත්ව	ගෘහස්ථ ප්‍රචන්ඩත්ව	එකතුව

01	අනුරාධපුරය	83	17			5		4	14				8				3			134
02	අම්පාර	12	34			2			2				1	1			1			53
03	අවිස්සාවෙල්ල	11	41			6					1		3			1	1			64
04	අත්තනගල්ල	8	23						6		3					8	2			50
05	අක්කරේපත්තු	5	118	1		4			6		2							1		137
06	බන්ඩාරවෙල	5	70	1		2					3		4			1				86
07	බත්තරමුල්ල											62								62
08	බද්දේගම	24	32			3			9		2					6			2	78
09	බදුල්ල	16	151	1		1	8	2	3	1	1			8			1			193
10	බලපිටිය	1	31			2														34
11	මඩකලපුව	15	35	1		5			1		3		4							64
12	බලංගොඩ	17	49	1		2														69
13	කොළඹ	7	1	4				2	13	8	7			1	3					46
14	හලාවත	5	30			1							44			1		1	1	83
15	චාවකච්චේරි	23	19	1		5			3		4								2	57
16	දඹුල්ල	11	49														1			61
17	දෙනියාය	13	56						1		1								3	74
18	දෙයියන්දර		17								10						8		2	37
19	ඇඹිලිපිටිය	26	113	3		4	1		11							2	5			165
20	ගම්පහ	8	21			1	1		2		1		3			3	1			41
21	ගාල්ල	12	54								2		3				1		1	73
22	ගල්ගමුව		39			1			1		8					1				50
23	හොරණ	32	1			1			3	26							2			65
24	හැටන්	10	15						1							10				36
25	හිඟුරක්ගොඩ	10	11			1				3	2			2					2	31
26	හම්බන්තොට	4		1			3		2		6			17			3			36
27	හෝමාගම	23	36	5		3	1	7		1	4		16	1		11	1			109
28	යාපනය	12	81	7			7	1			3		11	2				1		125
29	මහනුවර		2																	2
30	කුරුණෑගල	56		7		6		2	9	1	17		6			6	5	1		116
31	කෑගල්ල	6	11			8														25
32	කුලියාපිටිය	28	55	3		2			4	1	6		9				3			11
33	කන්තලේ	1	15			2								1						19
34	කඩුවෙල	10	69	4		3			7		5		3			16	1	1	1	120
35	කල්මුනේ	7	560	11		5								6			4	1	1	595
36	කලුතර	9	43	3		4				1	5		4			1				70
37	කැකිරාව	7	40	1															1	49
38	කඩවත		28								2									30
39	කැබිතිගොල්ලෑව		12																	12
40	කිලිනොච්චිය	1	12			3								5					1	22
41	මාතලේ	23	48			5					3		15						6	100
42	මහියංගනය	13	31			1										4	2			51
43	මතුගම	10	42	1		1			2						1	1				58
44	මහව	10	38			2			1		1					1				53
45	මාරවිල	3	22			22								2						29
46	මාවනැල්ල	27	38	2		10					2			18						97
47	මල්ලාහම්	9	33	4							3							1		50
48	ගල්කිස්ස	13	30	11	1	13		4	2	2	6		21	7		1	2			113
49	මන්නාරම	7	5	1		1								2						16

50	මොනරාගල	36	55	2		7	1		3	4	2			1			4			115
51	මුත්තූර්		5																	5
52	මුලතිව්	10	26			4											1		1	42
53	මාතර	16	39	1		16		1	10		2		2			7	1			95
54	මිනුවන්ගොඩ	4	2		1	1			2		4			1						15
55	නිකවැරටිය	21	42	1		7			7		3	1		7		11	3		1	104
56	නුවරඑළිය	6	16										1	33						56
57	මීගමුව	32	32	4		13				2	6		9			1	1		3	103
58	නුගේගොඩ	21	11	1		15				3	8		7	2		16	1	1	2	88
59	නාවලපිටිය	17	23	1		5					3		1				1			51
60	පොලොන්නරුව	10	31	3		9			14		1			1						69
61	පානදුර	53	71	1		13	8		15	3	9	11	29	1		5	4	1	6	230
62	පොතුවිල්	2	142	1		1														146
63	පේදුරුතුඩුව	10	21	1		2					2							2	1	39
64	පොල්ගහවෙල		41						2		16								6	65
65	පූගොඩ	9	43	3		5			1							5	6			72
66	පුත්තලම	16	82	1		1			2		2			2					2	108
67	රත්නපුර	31	50				3	1	3							6	1	1	2	98
68	තිස්සමහාරාමය	27	90			1											2			120
69	තඹුත්තේගම		85						1											86
70	තංගල්ල	6	56			3			3											68
71	ත්‍රිකුණාමලය	1	37			1							4							43
72	වවුනියාව	6	24			4														34
73	වාලවිවේනය	3	135			4														142
74	වරකපොල	13	18	1		2				1	5						1			41
75	වැලිමඩ	37	69			6					4			9					3	128
76	වලස්මුල්ල	10	78			12					2								1	103
77	වාරියපොල	13	23	3		6			8		59			3			1	1		117
78	වැල්ලවාය	23	34						6								2			65
79	**දෙනිඅත්තකණ්ඩිය**	6	13								2					3				24
80	**සියඹලාණ්ඩුව**		61						5			2				11			7	86
81	බොරැල්ල										4		54							58
82	**ගලඟෙදර**		18													4				22
83	වත්තල		16																	16
84	හෙට්ටිපොල		36									2								38
එකතුව		1072	3803	98	2	255	33	24	185	57	247	78	262	133	4	151	68	13	58	6543

වර්ෂ 2021.12.31 දිනට ඉදිරියට ගෙන ආ නඩු පිළිබඳ වරගකරණය

අනු අංකය	මධ්‍යස්ථානය	දික්කසාද	නඩත්තු	ඉඩම්	බෙදුම්	මුදල්	මහාධිකරණ නඩු	අභියාචනාධිකරණ නඩු	අනතුරු	ඇප	වෙනත්	ළමා අයිතිවාසිකම්	කම්කරු	අපරාධ	ශ්‍රේෂ්ඨාධිකරණ නඩු	අපරාධ විත්දිත	විශේෂ	භාරකාරත්ව	ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව	එකතුව
01	අනුරාධපුරය	293	961	20		26		4	101	2	23	7	19				13			1469
02	අම්පාර	72	163	12		14	1	1	10				35	1			1		5	315
03	අවිස්සාවෙල්ල	99	350	20		44	1	6			7		10	3		33	2	1	4	580
04	අත්තනගල්ල	179	661	32		33			48		7					2		2	3	967
05	අක්කරේපත්තු	27	482	7		29					2						10	2	2	561
06	බන්ඩාරවෙල	59	185	8	5	9			25		8		7			8	2		1	317
07	බත්තරමුල්ල											563								563
08	බද්දේගම	72	285	2	1	15			15							22	3		1	416
09	බදුල්ල	52	230	8		4	19	5	10				6	1				1		336
10	බලපිටිය	141	393	15	12	90	25		36	1	112		2		2	34	6	12	5	886
11	මඩකලපුව	45	89	38		20					5		2				2			201
12	බලංගොඩ	83	98	10		13					5						3	3		215
13	කොළඹ	303	504	113		23	4	74	173	8	254	27	22	15	73	57			2	1652
14	හලාවත	27	481	3		2	3		4		4		292	4		27	2		1	850
15	වාවකච්චේරි	21	150	10		9			6		7								3	206
16	දඹුල්ල	62	144	1		13								5				1	1	227
17	දෙනියාය	60	102	1					6					5					2	176
18	දෙයියන්දර		90						3		36					27			4	160
19	ඇඹිලිපිටිය	82	322	5		9				41	1	3	10	2		1	1		1	478
20	ගම්පහ	110	74	21	1	17	9	8	46		17		12			4	2		1	322
21	ගාල්ල	64	303			11	1	2	30	3	54	1	39	1		10			9	528
22	ගල්ගමුව		111			2			1		2			4		3			2	125
23	හොරණ	103	438	4		10		10	40	2	62						5		34	708
24	හැටන්	61	114	2					8							27				212
25	හිඟුරක්ගොඩ	126	363	6		42				90	6			118					13	764
26	හම්බන්තොට	183	577	1			28		47		74			151			7			1068
27	හෝමාගම	66	99	7	1	15	2	1		1	9		31			68	3	1	4	308
28	යාපනය	52	94	11		26	6	4			18		15	3					3	232
29	මහනුවර	181	414	57		124			17	1	56	7	37	1		5	1	1	1	903
30	කුරුණෑගල	252	595	21	3	77	14	25	67	5	19		41			16	16	3	4	1158
31	කෑගල්ල	110	301	31	13	76	22	6		5	67		27			29	1	5	2	695
32	කුලියාපිටිය	77	154	20	2	21			53		1		16	1		13	3	2	5	368
33	කන්තලේ	50	196	3		13					2	1		50				1	8	324
34	කඩුවෙල	90	57	18	2	89			22		4		21	2		17	3			325
35	කල්මුනේ	11	620	11	620						9						27			667
36	කලුතර	169	626	7		49	49		36	2	25		153			116	17			1249
37	කැකිරාව	133	143	6		5			27		4	2		40		2	6		3	371
38	කඩවත		274						7		3	1		3				1	9	298
39	කැබිතිගොල්ලෑව	134	220	9	45						37								3	448

40	කිලිනොච්චිය	70	340	6		36					26			39					29	546
41	මාකලේ	97	380	12		27					11		31						5	563
42	මහියංගනය	99	414	5		29					1						13	1	1	563
43	මතුගම	46	84	5		13												2	1	151
44	මහව	64	108	6	3	11			7					2		5	1			207
45	මාරවිල	57	305	4					14		1			30						411
46	මාවනැල්ල	138	229	3		15								12			1		2	400
47	මල්ලාහම්	87	429	31	1	31		3	2	1	18					4		5	1	613
48	ගල්කිස්ස	116	229	31		43		9	25		2		77	16		15	2	1	4	570
49	මන්නාරම	24	191	31		18			8		21			130				3	11	437
50	මොනරාගල	188	274	7		11	2		18	3	4			1			5			513
51	මුත්තූර්	22	383	4		30					52					7	2	1		501
52	මුලතිව්	63	356	15		27					6						8		17	492
53	මාතර	138	159	27	1	43		3	75	1	13		41			109	9	5	2	626
54	මීනුවන්ගොඩ	86	199	24	4	83			12	2	34	4		28		73			4	553
55	නිකවැරටිය	39	166	1		13			2			1				5		2		229
56	නුවරඑළිය	30	409	4		7								47			3			500
57	මීගමුව	140	97	19		46	1	1	8	1	5		20			8	1	2	2	351
58	නුගේගොඩ	83	235	8		53					5		1	7		58	3		12	465
59	නාවලපිටිය	72	398	7		10			1	5	48	2	5						4	552
60	පොලොන්නරුව	28	134	3		6		1	27		2								1	202
61	පානදුර	63	200	13	1	4	22		35	2	15	1	24	1		43	8		19	451
62	පොතුවිල්	2	196	1		2											4			205
63	පේදුරුතුඩුව	93	361	18	2	45			6		32							3	14	574
64	පොල්ගහවෙල		127	1					6		49	2							11	196
65	පූගොඩ	41	84	5		9			1							1	1			142
66	පුත්තලම	136	194	18		28	4		4	1	5			15			1		1	407
67	රත්නපුර	177	349	33		19	28	5	37	1	6		16			22	17	13	13	736
68	තිස්සමහාරාමය	89	95	1		1			10		2			26			20		7	251
69	තඹුත්තේගම		144																	144
70	තංගල්ල	45	106	1		2	8		14					4			1			181
71	ත්‍රිකුණාමලය	67	175	24		80					4		49					2		401
72	වවුනියාව	59	489	4		5			4								2			563
73	වාලවේචිනය	1	450			3														454
74	වරකපොල	48	152	6		43			1	5	37						3			295
75	වැලිමඩ	83	209	2		26			6		33	5		15		11	5		6	401
76	වලස්මුල්ල	97	158			33			13		4			5						310
77	වාරියපොල	32	66	4		3			13		7			7		5	5	1		143
78	වැල්ලවාය	51	238	12		1			28								4			334
79	දෙණිඅත්තකණ්ඩිය	22	147			6					2			3		39			18	237
80	සියඹලාණ්ඩුව		86						4		2					39		1	2	134
81	බොරැල්ල										39		136							175
82	ඉලඉෙදර		50													4				54
83	වත්තල		73						6		4		26	3				2	2	116
84	හෙට්ටිපොල		84						1	1	5					11				102
එකතුව		6442	21215	925	97	1792	249	168	1267	144	1437	624	1223	796	75	998	245	79	323	380999

2021 වසරේ පැවති නඩු අධිකරණය අනුව වරගකරණය

අනු අංකය	මධ්‍යස්ථානය	ශ්‍රේෂ්ඨාධිකාරණය	අභියාචනාධිකාරණය	සිවිල් අභියාචනාධිකාරණය	මහාධිකාරණය	දිසා අධිකාරණය	මහේස්ත්‍රාත් අධිකාරණය	කම්කරු විනිශ්චය සභාව	වෙනත්	එකතුව
01	අනුරාධපුරය			4	2	483	961	19		1469
02	අම්පාර		1		1	109	169	35		315
03	අව්ස්සාවේල්ල			6	1	175	388	10		580
04	අත්තනගල්ල					244	723			967
05	අක්කරේපත්තු					78	483			561
06	බන්ඩාරවෙල					111	199	7		317
07	බත්තරමුල්ල						563			563
08	බද්දේගම					108	308			416
09	බදුල්ල			5	20	75	230	6		336
10	බලපිටිය				25	281	468	2	110	886
11	මඩකලපුව					105	94	2		201
12	බලංගොඩ					117	98			215
13	කොළඹ	94	74	7	4	812	580	23	58	1652
14	හලාවත				3	38	517	292		850
15	චාවකච්චේරි					56	150			206
16	දඹුල්ල					77	150			227
17	දෙනියාය					67	109			176
18	දෙයියන්දර						160			160
19	ඇඹිලිපිටිය				1	141	326	10		478
20	ගම්පහ			8	9	201	79	12	13	322
21	ගාල්ල			2	4	107	324	39	52	528
22	ගල්ගමුව						125			125
23	හොරණ			10		162	536			708
24	හැටන්					71	141			212
25	හිඟුරක්ගොඩ					176	588			764
26	හම්බන්තොට				28	238	802			1068
27	හෝමාගම			1	3	93	171	31	9	308
28	යාපනය			4	6	107	100	15		232
29	මහනුවර			7	18	362	423	37	56	903
30	කුරුණෑගල		25		39	439	614	41		1158
31	කෑගල්ල			6	32	231	399	27		695
32	කුලියාපිටිය				2	178	172	16		368
33	කන්තලේ					73	251			324
34	කඩුවෙල					204	100	21		325
35	කල්මුනේ					38	629			667
36	කලුතර			39	10	278	742	153	27	1249
37	කැකිරාව					177	190		4	371

38	කඩවත						298			298
39	කැබිතිගොල්ලෑව					188	260			448
40	කිලිනොච්චිය					112	434			546
41	මාතලේ					136	385	31	11	563
42	මහියංගනය					137	426			563
43	මතුගම					67	84			151
44	මහව					91	116			207
45	මාරවිල					75	336			411
46	මාවනැල්ල					157	243			400
47	මල්ලාහම්			3	1	173	436			613
48	ගල්කිස්ස		9			193	289	77	2	570
49	මන්නාරම					105	332			437
50	මොනරාගල				5	232	276			513
51	මුත්තූර්					34	467			501
52	මුලතිව්					91	401			492
53	මාතර			7	7	299	272	41		626
54	මිනුවන්ගොඩ					204	349			553
55	නිකවැරටිය					55	174			229
56	නුවරඑළිය				1	87	410	2		500
57	මීගමුව			1	2	216	107	20	5	351
58	නුගේගොඩ					152	312	1		465
59	නාවලපිටිය					146	353	5	48	552
60	පොලොන්නරුව			1	1	65	135			202
61	පානදුර				24	140	254	24	9	451
62	පොතුවිල්					9	196			205
63	පේදුරුතුඩුව					184	390			574
64	පොල්ගහවෙල						196			196
65	පූගොඩ					56	86			142
66	පුත්තලම				4	192	211			407
67	රත්නපුර			5	28	298	389	16		736
68	තිස්සමහාරාමය					122	129			251
69	තඹුත්තේගම						144			144
70	තංගල්ල				8	63	110			181
71	ත්‍රිකුණාමලය					177	175	49		401
72	වවුනියාව					74	489			563
73	වාලවේනය					4	450			454
74	වරකපොල					113	182			295
75	වැලිමඩ					171	230			401
76	වලස්මුල්ල					134	176			310
77	වාරියපොල					58	85			143
78	වැල්ලවාය					96	238			334
79	දෙනියාත්තකණ්ඩිය					29	208			237
80	සියඹලාණ්ඩුව						134			134

81	බොරැල්ල							140	35	175
82	ගලගෙදර						54			54
83	වත්තල						90	26		116
84	හෙට්ටිපොල						102			102
එකතුව		94	109	116	289	11147	24675	1230	439	38099

2021 වර්ෂයේ පැවති නඩු සඳහා නීතිඥ සහාය ලබා දීම අනුව වර්ගීකරණය

අනු අංකය	මධ්‍යස්ථානය	නීති ආධාර කොමිෂන් සභාවේ නීතිඥවරුන්	නීති ආධාර කොමිෂන් සභාවට අයත් මණ්ඩලයේ නීතිඥවරුන්	එකතුව
01	අනුරාධපුරය	965	504	1469
02	අම්පාර	271	44	315
03	අවිස්සාවේල්ල	490	90	580
04	අත්තනගල්ල	686	281	967
05	අක්කරේපත්තු	561	0	561
06	බන්ඩාරවෙල	253	64	317
07	බත්තරමුල්ල	563	0	563
08	බද්දේගම	368	48	416
09	බදුල්ල	298	38	336
10	බලපිටිය	717	169	886
11	මඩකලපුව	199	2	201
12	බලංගොඩ	128	87	215
13	කොළඹ	937	715	1652
14	හලාවත	842	8	850
15	වාවකච්චේරි	206	0	206
16	දඹුල්ල	189	38	227
17	දෙනියාය	175	1	176
18	දෙයියන්දර	160	0	160
19	ඇඹිලිපිටිය	443	35	478
20	ගම්පහ	166	156	322
21	ගාල්ල	520	8	528
22	ගල්ගමුව	124	1	125
23	හොරණ	605	103	708
24	හැටන්	210	2	212
25	හිඟුරක්ගොඩ	706	58	764
26	හම්බන්තොට	629	439	1068
27	හෝමාගම	173	135	308

28	යාපනය	201	31	232
29	මහනුවර	319	584	903
30	කුරුණෑගල	656	502	1158
31	කෑගල්ල	470	225	695
32	කුලියාපිටිය	326	42	368
33	කන්තලේ	302	22	324
34	කඩුවෙල	87	238	325
35	කල්මුනේ	637	30	667
36	කලුතර	1066	183	1249
37	කැකිරාව	369	2	371
38	කඩවත	285	13	298
39	කැබිතිගොල්ලෑව	448	0	448
40	කිලිනොච්චිය	546	0	546
41	මාතලේ	398	165	563
42	මඟියංගනය	560	3	563
43	මතුගම	145	6	151
44	මහව	180	27	207
45	මාරවිල	403	8	411
46	මාවනැල්ල	361	39	400
47	මල්ලාඟම්	613	0	613
48	ගල්කිස්ස	332	238	570
49	මන්නාරම	437	0	437
50	මොනරාගල	398	115	513
51	මුත්තූර්	501	0	501
52	මුලතිව්	490	2	492
53	මාතර	489	137	626
54	මිනුවන්ගොඩ	397	156	553
55	නිකවැරටිය	217	12	229
56	නුවරඑළිය	414	86	500
57	මීගමුව	298	53	351
58	නුගේගොඩ	354	111	465
59	නාවලපිටිය	435	117	552
60	පොලොන්නරුව	196	6	202
61	පානදුර	276	175	451
62	පොතුවිල්	205	0	205
63	පේදුරුතුඩුව	574	0	574
64	පොල්ගහවෙල	174	22	196
65	පූගොඩ	93	49	142

66	පුත්තලම	407	0	407
67	රත්නපුර	388	348	736
68	නිස්සමහාරාමය	251	0	251
69	තඹුත්තේගම	48	96	144
70	තංගල්ල	132	49	181
71	ත්‍රිකුණාමලය	401	0	401
72	වවුනියාව	563	0	563
73	වාලවිවේචිනය	454	0	454
74	වරකපොල	46	249	295
75	වැලිමඩ	221	180	401
76	වලස්මුල්ල	302	8	310
77	වාරියපොල	116	27	143
78	වැල්ලවාය	315	19	334
79	දෙණිඅත්තකණ්ඩිය	231	6	237
80	සියඹලාණ්ඩුව	134	0	134
81	බොරැල්ල	153	22	175
82	ගලගෙදර	47	7	54
83	වත්තල	90	26	116
84	හෙට්ටිපොල	102	0	102
එකතුව		30637	7462	38099

1.2 වැඩසටහන් හා ව්‍යාපෘති

1978 සිට 2004 දක්වා වූ අවුරුදු 26 ක කාල පරාසය තුළ ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ මූලික අවධානයට ලක් වූයේ නඩු කටයුතු පවත්වාගෙන යාම සඳහා නීති ආධාර ලබා දීමේ සංකල්පයයි. නමුත් වර්ෂ 2004 පමණ කාල සීමාවක සිට මේ තත්ත්වයෙන් ඔබ්බට ගොස් මහජනතාව තුළ නෛතික සාක්ෂරතාවය ඇති කිරීම තුළින් යුක්තිය කරා පහසු ප්‍රවේශයක් ලබා දීමට හැකියාවක් ඇතැයි යන අපේක්ෂාවෙන් නීති ආධාර ලබා දීමේ නව ක්‍රමවේදයන් පිළිබඳව අත්හදා බැලීමට කොමිෂන් සභාව විසින් විවිධ පියවර ගනු ලැබිණි.

අරමුණු

ගැටළුවලට මැදිහත් වූ පාර්ශවය කෙරෙහි අවධානය යොමු කර විසඳුම් ලබා ගැනීම සඳහා උපකාර කිරීම ඉතාමත්ම වැදගත් ක්‍රියාවක් වන්නාසේම ගැටළු අවම කර ගනිමින් ජීවන කටයුතු පවත්වාගෙන යාමට උපදේශණ සිදු කිරීමත් අත්‍යාවශ්‍ය කටයුත්තකි. අවධානයෙන් ආරක්ෂාකාරීව කටයුතු කරන්නේ නම් බොහෝමයක් ක්‍රියාවන්ගෙන් ඇති විය හැකි අයහපත් ප්‍රතිවිපාක වලක්වා ගත හැකි වේ. ඒ සඳහා එදිනෙදා ජීවිතය පවත්වාගෙන යාමේ දී ප්‍රායෝගිකව බුද්ධිමත්ව කටයුතු කිරීම සඳහා සෑම අයෙකුටම දැනුමින් හා පුළුල් අවබෝධයකින් කටයුතු කිරීමට අවශ්‍ය සියුම් ඥානය පිළිබඳව හැඟීම් අවබෝධ කරවිය යුතුය. ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව මේ සම්බන්ධයෙන් ඉතා ඕනෑකමින් කරුණු වටහා ගනිමින් පුද්ගල ආරක්ෂාව හා රැකවරණයත්, අයිතිවාසිකම් ආරක්ෂා කර

දීමත්, උදෙසා නීති අංශයේ අධීක්ෂණය යටතේ වැඩසටහන් හා ව්‍යාපෘති ආරම්භ කර ක්‍රියාත්මක කරනු ලැබේ. මේ යටතේ නීති දැනුම හා අධ්‍යාපනය ලබා දීමේ වැඩසටහන් සැලසුම් කිරීමත් ක්‍රියාත්මක කිරීමත්, සංවිධානය කිරීමත් සිදු කරනු ලැබේ.

1. ගැටළු නිරාකරණයේ දී ආරවුල් වලින් තොරව සමථකරණයක් වීම වඩා වාසිදායක බවත්
2. යම් වැරදි ක්‍රියාවක් සිදු වීමෙන් හෝ සිදු කිරීමෙන් ඇති වන ප්‍රතිවිපාක වලින් ආරක්ෂා වීම සඳහා නීතිය නොදැනීම මත සිදු වූ ක්‍රියාවක් නිසා සමාව භජනය කිරීමට අයැදීම නිෂ්ඵල කරුණක් වීම හේතුවෙන් "නීතිය නොදැනීම සමාවට කරුණක් නොවේ". එහෙයින් නෛතික දැනුම සමාජගත කිරීම අත්‍යාවශ්‍ය කාලීන වැදගත්කමකින් යුත් කාරණයකි.
3. තව ද සමාජය තුළ නීතිගරුක භාවය වැඩිදියුණු කිරීමෙන් ගුණාත්මක සංවර්ධනය ඇති කරවීමත්, තිරසර සංවර්ධනය වෙනුවෙන් සමාජ සහභාගීත්ව වර්ධනය සිදු කිරීමත්,
4. නව නීති පැනවීමේ දී සිදු කළ යුතු කාලීන අවශ්‍යතා හා අදහස් යෝජනා සොයා බැලීමත්,
5. පුද්ගල නෛතික සාක්ෂරතාවය අභිවර්ධනයත්,

සිදු කිරීම වැඩසටහන් හා ව්‍යාපෘති සකස් කිරීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී සිදුකරනු ලබන මූලික අපේක්ෂාවන් වේ.

මෙම වැඩසටහන් සංවිධානය කිරීමේ දී නීති ආධාර කොමිෂන් සභාවේ නීති අංශයත්, ප්‍රාදේශීය නීති ආධාර කාර්යාල වල කාර්යය මණ්ඩලයත්, විවිධ රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන සංවිධාන, ප්‍රජා සහභාගීත්වය යන සියළු කාරණා වල ඒකරාශීත්වයෙන් ක්‍රියාත්මක වේ. මෙහි දී රජයේ අරමුදල් මෙන්ම විවිධ ආධාර වල ද සහයෝගීතාවයෙන් මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලැබිනි. ඇතැම් වැඩසටහන් කිසිඳු මූල්‍ය වැයකිරීමකින් තොරව ද ක්‍රියාත්මක කිරීමට හැකියාව ලැබී ඇත.

උදා :- ජනමාධ්‍ය වැඩසහටන්

1.2.1 <u>විවිධ වැඩසටහන්</u>

A. ජනමාධ්‍ය වැඩසටහන්
B. දැනුවත් කිරීම සඳහා වූ සමාජ සහභාගීත්ව වැඩසටහන්
C. සංවර්ධනාත්මක නීති ආධාර වැඩසටහන්

- බන්ධනාගාර රැඳවියන්, ආදිවාසීන්, විදේශගත ශ්‍රමිකයින් සඳහා වූ ඒකක
- නීති අධ්‍යයන වැඩසටහන්
- විද්වත් හා විවිධ ජන සමාජ කණ්ඩායම් අතර සංවාද හා කතිකාවත්
- නීතිය පිළිබඳ දැනුම සමාජ ගත කිරීමට අත්පත්‍රිකා, පෝස්ටර් හා ප්‍රකාශන සකස් කිරීම
- නව නීති සම්පාදනයට අවශ්‍ය අදහස් හා යෝජනා ලබා ගැනීමට අවශ්‍ය පර්යේෂණ කටයුතු හා සමීක්ෂණ කටයුතු සිදු කිරීම

A.ජනමාධ්‍ය වැඩසටහන්

රටෙහි පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් මහජනතාව ඒකරාශී කරමින් වැඩසටහන් සංවිධානය කිරීමට නීති ආධාර කොමිෂන් සභාව වෙත අපහසු වූ නමුත් පහත වැඩසහටන් සඳහා කොමිෂන් සභාවේ සම්පත් දායකත්වය ලබා දනෙ ලදී.

2021 වර්ෂයේ ජනවාරි මස සිට දෙසැම්බර් 31 දක්වා කාලය තුළ දී රූපවාහිනී වැඩසටහන් 23 ක් ද, ගුවන්විදුලි වැඩසහන් 07 ක් ද, සිදු කර ඇත.

2021 ජනමාධ්‍ය වැඩසටහන් - 30

අනු අංකය	වැඩසටහන	වැඩසටහන් සංඛ්‍යාව
01	රූපවාහිනී වැඩසටහන්	23
02	ගුවන්විදුලි වැඩසටහන්	07

A.1. <u>රූපවාහිනී හා ගුවන්විදුලි වැඩසහටන්</u>

මේවායින් බොහෝමයක් ආරාධිත වැඩසටහන් ය. මේ සඳහා කිසිදු මුල්‍ය වැය කිරීමක් කොමිෂන් සභාව මඟින් සිදු කර නොමැත. 2021 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා කාල සීමා තුළ රූපවාහිනී වැඩසටහන්, සියත නාලිකාව හා සිරස නාලිකාව, ටීඑන්එල් නාලිකාව මඟින් ද ගුවන්විදුලි වැඩසටහන් ශ්‍රී එෆ් එම් හා ස්වදේශීය සේවය යන නාලිකා මඟින් ද සිදු කර ඇත.

අනු අංකය	ජනමාධ්‍ය නාලිකාව	වැඩසටහන් සංඛ්‍යාව
01	සියත නාලිකාව	23
02	සිරස නාලිකාව	
03	ටීඑන්එල් නාලිකාව	
04	ශ්‍රී එෆ් එම්	07
05	ස්වදේශීය සේවය	

ඉහත වැඩසටහන් සඳහා සම්පත් දායකත්වය නීති ආධාර කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ මෙන්ම ප්‍රාදේශීය කාර්යාලවල සේවයේ නියුතු නීති නිලධාරීන් විසින් ලබා දී ඇත. මෙමඟින් විවිධ නෛතික මාතෘකා ඔස්සේ මහජනතාව දැනුවත් කිරීමත් එම ක්ෂේත්‍රයන්ට අදාළව මහජනතාවගේ ගැටළුවලට රූපවාහිනී හා ගුවන්විදුලි නාලිකා ඔස්සේ පිළිතුරු ලබා දීමට ක්‍රමවේදයක් ද සැකසී ඇත.

B. දැනුවත් කිරීම සඳහා වූ සමාජ සහභාගීත්ව වැඩසටහන්

පොදුවේ සමාජයේ දුබල පාර්ශවයන් ලෙස ගැනෙන දරුවන්, කාන්තාවන් හා වැඩිහිටි තැනැත්තන් බල ගැන්වීම හා ඔවුන්ගේ නෛතික රැකවරණය හා ආරක්ෂාව සුරක්ෂිත කිරීම උදෙසා මූලික අවධානය යොමු කිරීම මේවායේ අපේක්ෂාවයි.

එසේම ශක්තිමත් හා කාර්යක්ෂම රාජ්‍ය යාන්ත්‍රණයක් බිහිකිරීම උදෙසා නෛතික සාක්ෂරතාවය ලබා දීමට රජයේ ක්ෂේත්‍ර නිලධාරීන්, පොලිස් නිලධාරීන්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් වැනි පිරිස් ඉලක්කගත කණ්ඩායම් වශයෙන් හඳුනාගෙන ඇත.

තව ද සුභසාධක රජයක් ලෙස අවධානයට පාත්‍ර වියයුතු සුවිශේෂී කොටස් වශයෙන් හඳුනා ගෙන ඇත්තේ බන්ධනාගාර රැඳවියන්, ආදීවාසීන්, විදේශගත ශ්‍රමිකයින් ය.

B.1. <u>පාසල් වැඩසටහන්</u>

ඕනෑම ආකාරයක දැනුම සමාජගත කිරීම සඳහා සුදුසුම වයස හා කණ්ඩායම පාසල් සිසු දරුවන් වේ. ඉගෙන ගන්නා වයසේ දරුවන් තුළ ඇති කුතුහලය, දැනුම ලබා ගැනීමේ පිපාසය හා නව දැනුම සොයා යෑමට ඔවුන් තුළ ඇති රුචිකත්වය අභිප්‍රේරණය කිරීමෙන් ළමයා හරහා වැඩිහිටි සමාජයත් දැනුවත් කිරීම ඉතා පහසුය. මේ සංකල්පය ඔස්සේ විකාශය වූ ශ්‍රී ලංකා

නීති ආධාර කොමිෂන් සභාවේ පාසල් වැඩසටහන් අංශය විසින් ආකාර කිහිපයක් ඔස්සේ පාසල් වැඩසටහන් දියත් කරන ලදී.
එසේම දරුවන්ට අධ්‍යාපනය ලැබීමේ අයිතිය ආදරය ලබා ගැනීමේ හා රැකවරණය ලබා ගැනීමේ අයිතිය, අපරාධ වලින් දරුවන් ආරක්ෂා කර ගැනීම සඳහා අවශ්‍ය දැනුම දරුවන් වෙත ලබා දීම මෙම වැඩසටහන් වල දී ආවරණය කරනු ලැබිණි. දිවයිනේ විවිධ ප්‍රදේශ වල අතිදුෂ්කර පාසල් විෂයයෙහි මෙම වැඩසටහන් ක්‍රියාත්මක කෙරුණි.
ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ ළමයින් සඳහා වූ විශේෂ ඒකකය අවධානයට පාත්‍ර වී ඇති ළමයින් සඳහා වූ නඩත්තු නඩු ගණන 24018කි.

B.2. <u>කාන්තාවන් සඳහා වූ වැඩසටහන්</u>

ග්‍රාමීය කාන්තාවන්, අර්ධ නාගරික හා නාගරික කාන්තාවන් සියළු දෙනාම පාහේ කේන්ද්‍ර කර ගනිමින් මෙම වැඩසටහන් දියත් කෙරේ. මෙහි දී කාන්තාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම සේම ඇයට එරෙහිව සිදුවන සෑම සියළු ආකාරයකින්ම ප්‍රචන්ඩ ක්‍රියාවන් වලින් ආරක්ෂා කර ගැනීම සඳහාත් වන නීති කෙරෙහි අවධානයට ලක් කරමින් වැඩසටහන් හා අවශ්‍ය අවස්ථාවන්හිදි නෛතික රැකවරණය ලබා දීම මෙයින් සිදු කරනු ලැබේ.
කාන්තාවන් සඳහා වූ වෙනමම නීති ආධාර ඒකකයක් නීති ආධාර කොමිෂන් සභාවේ ක්‍රියාත්මක වේ. මෙම ඒකකය මඟින් 2021 වර්ෂයේ නීතිමය උපදෙස් ලබා දුන් කාන්තාවන් ගණන 19208 කි.
කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව වැඩසටහන් ලංකාවේ විවිධ ප්‍රදේශ වල ක්‍රියාත්මක කිරීමත් එහි දී එදිනෙදා ජීවිතයට බලපාන නීති තත්ත්ව දේපළ ආරක්ෂා කිරීම් සම්බන්ධව වූ නීතින්, නඩත්තු, ගෘහස්ථ ප්‍රචන්ඩත්ව, දික්කසාද, මූලික අයිතිවාසිකම්, කම්කරු නීති කෙරෙහි කාන්තාවන්ගේ විශේෂ අවධානයට ලක්කරනු ලැබ ඇත. නීති දැනුම ලබා දීමේ වැඩසටහන්, විවිධ කතිකාවත්, නීති ආධාර ලබා ගැනීම සඳහා ප්‍රවේශ වීමට මග පෙන්වීමත් මෙහි ලා සිදු කරනු ලැබ ඇත.
එසේම මෙම වසර තුළ දී ජාතික කාන්තා කමිටුව නියෝජනය කිරීමට ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවට හැකි විය.

B.3. <u>ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා වූ වැඩසටහන්</u>

ලෝකයේ දියුණු වෙමින් පවත්නා රටවල් අතර ඉතා සිඝ්‍රයෙන් වියපත් ජනතාවක් බිහිකරන රටක් ලෙසට හැඳින්වෙන ශ්‍රී ලංකාව ඉතා සුවිශේෂී ජනගහන විද්‍යාත්මක විපර්යාසයකට මුණ දෙමින් සිටී. රටේ සමස්ථ ජනගහනයෙන් 1/10 ක් පමණ වන වැඩිහිටි ජනගහනය වර්ෂ 2050 පමණ වනවිට දෙගුණයකින් වැඩි වර්ධනයක් වන බවට ජනගහන විද්‍යාඥයින් විසින් අනාවැකි පලකර ඇත. රටක ආයු අපේක්ෂාව ඉහල යාම හෝ වියපත් ජනගහනය වැඩි වීම එක් අතකින් සංවර්ධිත රටක ලක්ෂණ පෙන්නුම් කරන්නක් වුවත් වැඩි වන වැඩිහිටි ජනගහනයට සාපේක්ෂව අවශ්‍ය අනෙකුත් සුභසාධන පහසුකම් වර්ධනය නොවීම එක්තරා අතකින් අභියෝගයකි.
පිරිස් බලයෙන් ඉතා ඉහල මෙන්ම මෙම පිරිස අත්දැකීමෙන් මෙන්ම දැනුමෙන් ද සන්නද්ධ කණ්ඩායමක් බවට පත් කිරීමෙන් ඉතා සාධනීය ප්‍රතිපල නෙලා ගත හැකි බව ප්‍රායෝගිකව ඔප්පු කර හරමාය.

වසර 30 ක යුද්ධයක් තිබූ ශ්‍රී ලංකාවේ සමාජය තුළ ජ්‍යෙෂ්ඨ පුරවැසි ජනගහනය සංඛ්‍යාත්මකව ඉහළ අගයක් ගෙන ඇති අතර සමාජ සුභ සාධක සංකල්පය බලගැන්වීම හා යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය උදෙසා ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ආරක්ෂාව හා රැකවරණය පිළිබඳ සහතියක් තිබිය යුතුය. මුළු ජනගහනයෙන් 11% ක් වන ජ්‍යෙෂ්ඨ පුරවැසි ප්‍රජාව, ඡන්ද හිමියන්ගෙන් 20% කි. එම තත්ත්වය තුළ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් වර්ෂ 2000 අංක 09 දරණ වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත නීති ගත කිරීම තුළ එකී වටිනාකම් තහවුරු කර ඇත.

මෙවන් පසුබිමක් තුළ ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව ස්වකීය ජ්‍යෙෂ්ඨ පුරවැසි නීති අංශයේ කටයුතු ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලැබ ඇත. ප්‍රාදේශීය මට්ටමින් පවත්නා වැඩිහිටි සංගම් වල සාමාජිකයන්ගේ නීතිමය ගැටළු වලට නොමිලේ විසඳුම් ලබා ගැනීමට සහාය දීමත් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් ලබා දී ඇති වැඩිහිටියන්ට නඩත්තු ලබා ගැනීම සම්බන්ධයෙන් වූ නියෝග මහේස්ත්‍රාත් අධිකරණය මඟින් බලගන්වා ගැනීමේ ක්‍රියාවලියත් ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව මඟින් සිදු කරනු ලැබේ. එසේම ප්‍රාදේශීකව පවත්නා බිම් මට්ටමේ වැඩිහිටි සමිති වල සාමාජිකයින් සඳහා නීතිය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් සිදු කරනු ලැබේ.

B.4. <u>රජයේ නිලධාරීන් සඳහා වූ වැඩසටහන්</u>

පොදුවේ සමස්ථ රාජ්‍ය නිලධාරීන් කෙරෙහිම අවධානය යොමු කරමින් නීති දැනුම ලබා දීමේ වැඩසටහන් සිදු කරන අතරම සුවිශේෂී ක්ෂේත්‍ර වල නිරත වන නිලධාරීන් අරභයා ද නීති දැනුම ලබා දීමේ වැඩසටහන් ක්‍රියාත්මක වේ. රාජ්‍ය නිලධාරීන්ගේ වෘත්තීය නිපුණත්වය වැඩි දියුණු කිරීමත්, කාර්යක්ෂම රාජ්‍ය යාන්ත්‍රණයක් බිහි කිරීමත් නීති ගරුක අවංක තෘප්තිමත් රාජ්‍ය සේවකයක් නිර්මාණය කිරීමත් උදෙසා නීති ආධාර කොමිෂන් සභාව විසින් ඉටු කළ යුතු කාර්ය භාරයක් ලෙසට මෙය සිදු කෙරේ.

කොමිෂන් සභාවේ ව්‍යාපෘති අංශය සහ ප්‍රාදේශීය නීති ආධාර කොමිෂන් සභා කාර්යාල එකතුව මේවා දිවයින පුරා විවිධ රාජ්‍ය, අර්ධ රාජ්‍ය සහ පළාත් රාජ්‍ය කාර්යාල වල සිදු කරනු ලැබ ඇත.

මෙහි දී පරිපාලන නීතිය, මානව හිමිකම් නීතිය, ඉඩම් සම්බන්ධ නීති තත්ත්ව, අල්ලස් හා දූෂණ නීතිය, කම්කරු නීතිය, පවුල් හා බැඳි නීතීන් කෙරෙහි අවධානයට ලක්කොට ඇති ක්ෂේත්‍ර වේ. දේශණ මඟින් වැඩසටහන් සිදු කිරීමත්, පුහුණු පාඨමාලා සහ නිබන්ධන තුළින් දැනුම සම්ප්‍රේශණය කිරීම සඳහා කටයුතු කර ඇත.

සමස්ථයක් වශයෙන් ග්‍රාම නිලධාරීන්, සමෘද්ධි නිලධාරීන්, කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාර නිලධාරීන්, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සිටින ක්ෂේත්‍ර නිලධාරීන් මෙම වැඩසටහන් වල දී ඉලක්ක ගත කණ්ඩායම් වශයෙන් හඳුනාගෙන ඇත.

B.5. <u>පොලිස් නිලධාරීන් සඳහා වූ වැඩසටහන්</u>

නීතිය හා සාමය ආරක්ෂා කිරීමෙහි ලා විශාල කාර්ය භාරයක් සිදු කරන රාජ්‍ය නිලධාරී තන්ත්‍රය පොලිස් සේවයයි. පොලිස් සේවයේ නිරත සියළු නිලධාරීන් අධිකරණ කටයුතු හා නීති ක්ෂේත්‍රය පිළිබඳ හොඳ අවබෝධයකින් හා දැනුමකින් යුක්ත විය යුතුය. පොලිස්

සේවයට නිලධාරීන් බඳවා ගන්නා අවස්ථාවේ දී නීති ක්ෂේත්‍රය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා දෙන නමුත් සේවයේ නිරත වූවායින් අනතුරුව විවිධ අවස්ථාවන් හි දී සිදු කරනු ලබන නෛතික සංශෝධන හා අලුත් අණ පනත් හා නීති රෙගුලාසි පිළිබඳව ඔවුන් ලබා ගන්නා දැනුම සීමිතය. එම දැනුම එක් රැස්කර ගැනීමට ලැබෙන අවස්ථාවන් ද සුලභ නොවේ.
එහෙයින් පොලිස් නිලධාරීන්ගේ වෘත්තීය නිපුණත්වය වර්ධනය කිරීම සඳහා නීති දැනුම ලබා දීමේ වැඩසටහන් සිදු කළ යුතුව ඇත. මේ සඳහා ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව හා ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව ඒකාබද්ධව දිවයින පුරා විවිධ පොලිස් ස්ථාන වල සේවයේ නියුතු නිලධාරීන් නීතිමය දැනුම පිළිබඳව දැනුවත් කිරීමේ හා පුහුණු කිරීමේ වැඩසටහන් කලක් තිස්සේ සිදු කරමින් පවති. අපරාධ නීති ක්ෂේත්‍රය සේම, සිවිල් හා පරිපාලන නීති ක්ෂේත්‍ර වල දැනුමත් පොලිස් නිලධාරීන්ට ලබා දීම මෙහි දී සිදු කරනවා ඇත.

B.6 <u>වෛද්‍ය නිලධාරීන් සඳහා වූ වැඩසටහන්</u>

ස්වකීය වෘත්තිමය ක්ෂේත්‍රයේ සෑම අවස්ථාවන් හි දීම නීතිය සමඟ ගනුදෙනු කිරීමට සිදු වූවත් වෙනත් රාජ්‍ය නිලධාරීන් හා සාපේක්ෂව බලන කල නීති ක්ෂේත්‍රය පිළිබඳ දැනුම ලබා ගැනීමට ඇති අවස්ථා අල්ප වශයෙන් ඇති රාජ්‍ය නිලධාරී කාණ්ඩයකි වෛද්‍ය නිලධාරීන්. යම් අවස්ථාවන් හි දී අධිකරණ කටයුත්තකට සහාය වීමට වෛද්‍ය නිලධාරීන්ට සිදු වූවත් එම කටයුතු වලට සහය විය යුතු ආකාරය පිළිබඳ විධිමත් පුහුණුවක් ලබා ගැනීමට අවස්ථාව ලැබෙන්නේ වෛද්‍යවරුන්ගෙන් ස්වල්ප දෙනෙකුට පමණි. බොහෝ අධිකරණ වෛද්‍ය නිලධාරීන්ට මුහුණ පෑමට සිදු වන බැරුරුම් ප්‍රශ්නයකි එය.
මරණ පරීක්ෂණ වල දීත් ඒ සම්බන්ධයෙන් සාක්ෂි ලබා දීමට අධිකරණ වලට පැමිණෙන අවස්ථාවන් හි දීත් අධිකරණමය කටයුතු වලට අවශ්‍ය වන විශේෂඥ සාක්ෂි ලබා ගන්නා අවස්ථාවන් හි දීත් නඩු භාණ්ඩ එකතු කිරීම හා ඉදිරිපත් කිරීම හා විශ්ලේෂණය කිරීම සම්බන්ධයෙනුත් අධිකරණ වෛද්‍ය නිලධාරීන්ට මුහුණ පෑමට සිදු වන්නේ බැරුරුම් අභියෝගයන්ට ය.
එසේම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ට ද තම වෘත්තීය ක්ෂේත්‍රයේ දී බොහෝ අවස්ථා වල අධිකරණමය කටයුතු වලට සහය වීමට සිදු වුවත් නීති ක්ෂේත්‍රය පිළිබඳ අවබෝධය අල්පය. එහෙයින් වෛද්‍ය වෘත්තිකයින් නීතිය පිළිබඳ දැනුවත් කිරීම වෘත්තීයභාවය වැඩිදියුණු කිරීමක් සේම සමාජ සාධාරණත්වය සුභ සාධනය හා යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට මහෝපකාරී වන්නකි.
වෛද්‍ය වෘත්තිකයින් නීතිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනවා සේම නීති වෛද්‍ය සායන පැවැත්වීම මඟින් මහජනතාවට සුවිශේෂී කාර්ය භාරයක් සිදු කිරීම ද මේ හරහා කටයුතු කර ඇත. බෝනොවන රෝග වැලැක් වීමේ ප්‍රජා සෞඛ්‍ය සත්කාරයේ දී වෛද්‍ය වෘත්තිකයින් සමඟ අත්වැල් බැඳ ගනිමින් දිවයින පුරා පිහිටි ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ කාර්යාල වල නිලධාරීන් කටයුතු කරනු ලැබ ඇත.
Covid -19 වසංගත තත්ත්වය හේතුවෙන් Zoom තාක්ෂණය යොදා ගනිමින් ජනවාරි සිට දෙසැම්බර් 30 දක්වා කාලය තුළ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කර ඇත.

B.7 <u>ජංගම නීති සායන</u>

නීති ආධාර කොමිෂන් සභාව පිහිටුවීමේ අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමෙලා ඉතාම වැදගත් ව්‍යාපෘතිය ජංගම නීති සායන පැවැත් වීමයි. මේ තුළින් නීති ආධාර වැඩපිළිවෙල බිම් මට්ටමේ ප්‍රජාව අතර ව්‍යාප්ත කිරීමත්, ගැටළු හඳුනා ගැනීම, පොදු මහජනතාව යුක්තිය කරා ප්‍රවේශ කිරීම වඩා පහසු කර වීම සිදු වනවා ඇත. දිවයිනේ පිහිටා ඇති ප්‍රාදේශීය නීති ආධාර කාර්යාල හරහා මෙම වැඩ පිළිවෙල බිම්මට්ටමෙන් ක්‍රියාත්මක වේ. අඩු ආදායම්ලාභී ජනතාව වෙනුවෙන් නොමිලේ නීතිඥ සහාය ලබා දීම සඳහා සුදුසු තැනැත්තන් හඳුනා ගැනීම මේ කාර්යයෙන් වඩාත් පහසු කරවනු ලැබේ.

1.2.2 දැනුවත් කිරීම සඳහා වූ සමාජ සහභාගීත්ව වැඩසටහන් 2021 - මෙම වර්ෂය තුළ දී පවත්වා ඇති වැඩසටහන් හා එහි බෙදීයාම පහත පරිදි වේ.

රටේ පැවති Covid -19 වසංගත තත්ත්වය හේතුවෙන් මහජනතාව ඒකරාශී කරමින් වැඩසටහන් සංවිධානය කිරීමට නීති ආධාර කොමිෂන් සභාව වෙත අපහසු වූ නමුත් පහත වැඩසටහන් සඳහා කොමිෂන් සභාවේ සම්පත් දායකත්වය ලබා දෙන ලදී.

	වැඩසටහන	සංඛ්‍යාව
01	USAID ආයතනයේ සහයෝගය ඇතිව නීති ආධාර කොමිෂන් සභාවේ නීති නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කිරීම.	02
02	UNDP ආයතනයේ සහයෝගය ඇතිව අධිකරණ ක්ෂේත්‍රයේ නඩු කටයුතු සඳහා Zoom තාක්ෂණය ඔස්සේ බන්ධනාගාර රැඳවියන් සඳහා වැඩසටහන් කිරීම	06
03	නීති ආධාර කොමිෂන් සභා බද්දේගම මධ්‍යස්ථානය මඟින් 2021.02.07 හා 2021.02.16 යන දියන්හි දී බද්දේගම අම්පේගම සණස සමිතිය හා බද්දේගම සන්දරවල සරණංකර ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථාන පරිශ්‍රයේ දී ළමයින් නීතිය සම්බන්ධයෙන් දැනුවත් කිරීම වැඩසටහන් 2ක් සංවිධානය කොට පැවැත්විම	02
04	නීති ආධාර කොමිෂන් සභා මාතර මධ්‍යස්ථානය මඟින් 2021.01.27 හා 2021.02.24 යන දියන්හි දී දික්වැල්ල හා තිහගොඩ ප්‍රාදේශීය ලෙක්ම් කාර්යාල පරිශ්‍රයන්හි දී රජයේ නිලධාරීන් නීතිය සම්බන්ධයෙන් දැනුවත් කිරීම.	02
05	නීති ආධාර කොමිෂන් සභා නිකවැරටිය මධ්‍යස්ථානය මඟින් 2021.02.06 වන දින නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී රජයේ නිලධාරීන් නීතිය සම්බන්ධයෙන් දැනුවත් කිරීම	01
06	නීති ආධාර කොමිෂන් සභා මල්ලාකම් මධ්‍යස්ථානය මඟින් 2021.02.24 වන දින මණපේ කාන්තා විද්‍යාලයේ දී රජයේ නිලධාරීන් නීතිය සම්බන්ධයෙන් දැනුවත් කිරීම	01
07	නීති ආධාර කොමිෂන් සභා අවිස්සාවේල්ල මධ්‍යස්ථානය මඟින් 2021.02.18 දින තල්දූව බෞද්ධ මධ්‍යස්ථානයේ දී නීතිය සම්බන්ධයෙන් දැනුවත් කිරීම.	01
08	නීති ආධාර කොමිෂන් සභා මුත්තූර් මධ්‍යස්ථානය මඟින් 2021.02.27 වන දින මල්ට්‍රිපර්පස් ශාලාවේ දී නීතිය සම්බන්ධයෙන් දැනුවත් කිරීම.	01
09	Zoom තාක්ෂණය ඔස්සේ පවත්වනු ලැබූ අපරාධ යුක්ති ක්‍රියාවලිය වැඩසටහන 05 ක් සඳහා නීති ආධාර කොමිෂන් සභාවේ හොරණ හා කඩුවෙල මධ්‍යස්ථානයන් හි නීති නිලධාරීන් සහභාගී වීම	05

10	නීති ආධාර කොමිෂන් සභා පානදුර මධ්‍යස්ථානය මඟින් 2021.01.26 දින කලුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයේ පොලිස් නිලධාරීන් නීතිය සම්බන්ධයෙන් දැනුවත් කිරීම වැඩසටහනක් සඳහා සම්පත් දායකත්වය ලබා දීම.	01
11	කලුතර ජාතික සෞඛ්‍ය විද්‍යායතනය මඟින් 2021.03.29 වන දින සංවිධානය කරන ලද වැඩසටහනක් සඳහා කලුතර නීති ආධාර කොමිෂන් සභා නීති නිලධාරිනියගේ සම්පත් දායකත්වය ලබා දීම	01
12	ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව හා නීති විද්‍යාලය සමඟ එක්ව සිදු කරනු ලබන 2021 වර්ෂයට අදාළ ආධුනික නීතිඥවරුන් පුහුණු කිරීමේ වැඩමුළුව Zoom තාක්ෂණය යොදා ගනැමින් සිදු කිරීම	01
13	කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨයේ සිංහ සමාජය හා නීති ආධාර කොමිෂන් සභාවේ නීති නිලධාරීන් ඒකාබද්ධව මහජනතාවගේ නීති ගැටළු සඳහා Zoom තාක්ෂණය යොදා ගනැමින් විසඳුම් ලබා දීම සිදු කිරීම	01
14	කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් දැනුවත් කිරීම Zoom තාක්ෂණය යොදා ගනැමින් සිදු කිරීම	01
15	නීති ආධාර කොමිෂන් සභාවේ සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් සමඟ කල නීතිය දැනුම් කිරීමේ වැඩසටහනක් Zoom තාක්ෂණය යොදා ගනැමින් සිදු කිරීම	10
16	ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතියන්හට නීති සහන ලබා දීම පිළිබඳ Tranparants International ආයතනය සමඟ සාකච්ඡාවක් Zoom තාක්ෂණය යොදා ගනැමින් සිදු කිරීම.	01
17	නීතිය සංවිධානය මඟින් සංවිධානය කල සාකච්ඡාමය වැඩසටහන සඳහා ප්‍රධාන කාර්යාලයේ නීති නිලධාරිනියක සහභාගී වීම	01
18	ජාත්‍යන්තර පූරිස් කොමිෂම මඟින් නීති ආධාර කොමිෂන් සභාවේ තෝරා ගත් ජ්‍යෙෂ්ඨ නීතිඥවරුන් සඳහා webinar මාර්ගයෙන් සිදු කරන ලද නීතය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩාසටහන් මාලාව	02
19	කාන්තා කටයුතු අමාත්‍යාංශය විසින් වින්දිත කාන්තාවන්ට රැකවරණය ලබා දීමේ රැකවරණ නිවාස පිළිබඳ ජාතික වැඩසටහනේ සාකච්ඡාව සඳහා ප්‍රධාන කාර්යාලයේ නීති නිලධාරිනියක් සහභාගී වීම	01
20	මිතුරු පියස මඟින් සංවිධානය කරන ලද විශේෂඥ සේවාවන් සපයන නිලධාරීන් හා වෛද්‍යවරුන් නීතිය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහනට සම්පත් දායකත්වය ලබාදීම.	03

C. සංවර්ධනාත්මක නීති ආධාර වැඩසටහන්

C.1. බන්ධනාගාර රැඳවියන් සඳහා වූ වැඩසටහන

නුෂ්‍යයෝ ය”. මෙම සංකල්පය කෙරෙහි ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ අවධානය 2002 වර්ෂයේ සිට යොමු වී ඇත. ඒ අනුව දීර්ඝ කාලයක් බන්ධනාගාර තුළ ඇප නොමැතිව හෝ ඇප කොන්දේසි අධිකරණයට තෘප්ත කිරීමට නොහැකිව සිටින රැඳවියන්ට නීති ආධාර සැපයීම මෙම වැඩසටහනේ මුඛ්‍ය පරමාර්ථයයි. මේ අනුව බන්ධනාගාර දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව දිවයින පුරා පිහිටි බන්ධනාගාර වල රඳවා තබා ඇති රැඳවියන් සඳහා නීති ආධාර සායන පවත් වමින් අවශ්‍ය තොරතුරු එක් රැස්කර ගැනීම සිදු කරනු ලැබේ. තොරතුරු ලබා ගැනීමෙන් අනතුරුව නීති ආධාර ලබා දීම සඳහා තොරා ගන්නා රැඳවියන්ට ඔවුන්ගේ නඩු කටයුතු වෙනුවෙන් නොමිලේ නීතිඥ සහාය ලබා දීම සිදු කරනවා ඇත.

ඒ අනුව 2021 වර්ෂයේ පැවති Covid -19 වසංගත තත්ත්වය හේතුවෙන් Zoom තාක්ෂණය යොදා ගනිමින් මාර්තු මස සිට සැප්තැම්බර් 30 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ බන්ධනාගාර ආශ්‍රිතව නීති ආධාර සායන හා ඇප ලබා ගැනීමේ කටයුතු සිදු කිරීමට UNDP ආයතනය හා නීති ආධාර කොමිෂන් සභාව එක්ව කටයුතු කර ඇත. ඒ අනුව මෙම වසර තුළ දී ඇප නඩු 201 ක ප්‍රමාණයක් සඳහා නීති ආධාර ලබා දී ඇත.

C.2. ආදි වාසීන් සඳහා වූ වැඩසටහන

වසර ගණනාවක ඉතිහාසයකට උරුමකම් කියන ආදිවාසී ප්‍රජාවන් ලෝකයේ විවිධ රටවල ජීවත් වේ. ඇමරිකාවේ රතු ඉන්දියානුවන්, අප්‍රිකාවේ පිග්මිවරු, ඔස්ට්‍රේලියාවේ ඇබෙරිජියන්වරු මෙන්ම ශ්‍රී ලංකාවේ වැදි ජනතාව ද ඒ අතරින් ප්‍රධාන වේ.

ශ්‍රී ලාංකික ඉතිහාසයේ ආදිතම පාර්ශවය නියෝජනය කරනු ලබන මෙම ජනතාව අධ්‍යාපන, ආර්ථික, සෞඛ්‍ය, රැකියා සහ වාස භූමි යන සියලු ආකාරයේ තත්ත්වයන්ගෙන් ප්‍රාථමික අවධියේ පසුවනු ලබන්නෝ ය. නව ලෝකයට ගැලපෙන අයුරින් ඔවුන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවීමේ දී ඔවුන් තුළ නෛතික සාක්ෂරතාවය වර්ධනය කිරීමත් ඔවුන් වෙත නීති ආධාර ලබා දීමත් අත්‍යාවශ්‍ය කාරණයක් බව පෙනේ. එසේම ආදිවාසී ජන ප්‍රජාව ආරක්ෂා කිරීම අප රටේ ඓතිහාසික උරුමයන් ආරක්ෂා කිරීමේ වගකීම ඉෂ්ට කිරීමේ කාර්ය භාරයක් වන්නේ ය.

ආදිවාසී ජන උරුමයන් ආරක්ෂා කිරීම සහ මහජනතාව වෙත ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ලබා දී ඇති වරප්‍රසාද ලබා ගැනීමේ ලා වූ යුක්තිය කරා පහසු සහ සමප්‍රවේශය ඇති කිරීමේ යාන්ත්‍රණය බලගැන්වීම සහ වඩා නම්‍යශීලි සහ ඵලදායී නීති ප්‍රතිසංස්කරණ ඇති කිරීමට රාජ්‍ය අවධානය යොමු කිරීම සිදු විය යුතුය. සර්වසාධාරණත්වය සහ සමානාත්මතාවයේ අයිතිවාසිකම් භුක්තිවිඳීමට සෑම සියළු ජන කොට්ඨාශයකටම ඉඩ ප්‍රස්ථාව පුළුල් විය යුතුය. ඉහත කී කාරණා සඳහා රාජ්‍ය අවධානය යොමු කර නීති ප්‍රතිසංස්කරණ සිදු කිරීමට කටයුතු කිරීම මෙම ව්‍යාපෘතියේ මුඛ්‍ය අරමුණයි.

ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශයන්හි ජීවත් වන ආදිවාසීන් හමු වීම මඟින් ඔවුන්ගේ වාස භූමිය, සාම්ප්‍රදායික සිරිත්, ජනජීවිතය, ජීවිකාව, අධ්‍යාපන මට්ටම, වාසස්ථාන හා සම්බන්ධව ඇති වර්තමාන අභියෝග හඳුනා ගැනීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණකි. ඒ අනුව ආදිවාසී ජනතාවගේ එදිනෙදා ජීවිතයට බලපාන නීතිමය ගැටළු පිළිබඳ සාකච්ඡාමය කතිකාවත් නිර්මාණය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ අතර ප්‍රමුඛත්වය ගනී.

එසේම ආදි වාසීන්ගේ උරුම අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ වැඩපිළිවෙල යටතේ දළුකාන ආදි වාසී ගම්මානය ආශ්‍රිතව වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. එහි දී ආදි වාසීන්ගේ බාල, තරුණ, වැඩිහිටි යන සියලු ප්‍රජාවන් කේන්ද්‍රකොට ගනිමින් නීති වෛදය සායන ගැටලු විසඳීමේ ව්‍යාපෘතින් ක්‍රියාත්මක කොට ඇත.

C.3. විදේශගත ශ්‍රමිකයින් සඳහා වූ වැඩසටහන

ශ්‍රී ලංකාවේ ආර්ථිකයට වඩා වැඩි දායකත්වයක් සපයමින් මෙරටට විදේශ විනිමය ගෙනු එනු ලබන විගමනික ශ්‍රමිකයන්ගේ රැකියා සුරක්ෂිතභාවය, ජීවිත සුරක්ෂිතභාවය පිළිබඳ විශේෂ ආරක්ෂාවක් හා රැකවරණයක් තහවුරු කර ගත යුතුය. ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයින් සංඛ්‍යාත්මකව දිනෙන් දින වැඩිවන අතර ඔවුන්ගේ සුරක්ෂිතභාවයන් වෙනුවෙන් නව නීති ප්‍රතිපාදන ස්ථාපිත කර ඇති අතර ඒ මඟින් නීත්‍යානුකූල නොවන අයුරින් විදේශ ගත වීම වැලැක්වීම කටයුතු කිරීම තුළ විගමණික ශ්‍රමිකයන්ගේ රැකවරණය හා ආරක්ෂාව වඩාත් ස්ථායී වේ. අපගේ විගමණික සේවකයන්ගෙන් වැඩි දෙනෙකු ශ්‍රී ලාංකික කාන්තාවන් වන අතර ඔවුන්ගේ දුගී බව හා අඩු ආදායම් මට්ටම මේ සඳහා පාදකවී ඇත. වැඩි දෙනෙක් මැදපෙරදිග කලාපයේ රැකියාවන්හි නිරත වන නුපුහුණු ශ්‍රමිකයින් ගෘහසේවිකාවන් හා අර්ධ පුහුණු සේවකයින් ය. තාවකාලිකව රැකියා සඳහා විදේශ ගත වන බොහෝමයක් සඳහා ඉතා හොඳ වෙළඳපොලක් හා ඉල්ලීමක් ඇත්තේ මැද පෙර දිග කලාපයේ ය. පුහුණු හා හොඳ

තත්ත්වයේ විදේශ ගත ශ්‍රමිකයින් සඳහා වෙළඳපල නැගෙනහිර ආසියාව හා බටහිර ආසියාව කේන්ද්‍ර කොට ව්‍යාප්ත වී ඇත.

ශ්‍රී ලාංකික විදේශගත ශ්‍රමික කාන්තාවන් බොහෝ දෙනෙක් මැදපෙර දිග කලාපයේ ගෘහසේවිකාවන් වශයෙන් කටයුතු කරනු ලබයි. මෙම ගෘහසේවිකාවන්ගෙන් වැඩි දෙනෙක් නුපුහුණු හා කාර්යක්ෂම බවින් අඩුවීම හේතුකොටගෙන ඔවුන්ගේ සේවා ස්ථානයන්හි විශාල වශයෙන් ඔවුන්ට හිමි කම්කරු අයිතිවාසිකම් අහිමි වීම්, අපයෝජන, ශාරීරික හා මානසික හිංසන වැනි මානව හිමිකම් කඩ වීම් වල ගොදුරු බවට පත් වී ඇත. එසේම ඇතැම් විගමණික කාන්තාවන් විදේශයන්හිදී අපරාධ හා වැරදි වලට මුහුණ පෑමට සිදු වන අවස්ථාවන් හි දී විශාල අපහසුතාවන්ට පත්වේ. වැඩි දෙනෙක් එම රට වල නීතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව කිසිවක් නොදනී.

ගැටලු වලට මුහුණ පෑ විදේශගත ශ්‍රමිකයින් සඳහා ස්වකීය සේවය මෙම අංශය මඟින් සිදු කරනු ලැබේ. උපදේශන සේවය ලබා දීමෙන් පසුව එම තැනැත්තන් විදේශ කටයුතු අමාත්‍යාංශයේ කොන්සියුලර් අංශය වෙත හෝ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත හෝ අවශ්‍ය අවස්ථාවන්හි දී අධිකරණමය කටයුතු උදෙසා යොමු කිරීමෙන් ස්වකීය කාර්ය භාරය ක්‍රියාත්මක කෙරේ. විදේශගත ශ්‍රමික පවුල් දැනුවත් කිරීමේ වැඩසටහන්, ඔවුන්ගේ තොරතුරු රැස්කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් මට්ටමින් "ගැමි සංසදය" නමැති ප්‍රජා මූල 17 අධීක්ෂණය කිරීම හා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක වෙමින් මෙම ඒකකය කටයුතු කරනු ලැබේ.

C.4. නීති අධ්‍යාපන වැඩසටහන

I. විධිමත් නීති අධ්‍යාපන වැඩසටහන

මෙය ශ්‍රී ලංකා නීති විද්‍යාලය සමඟ ඒකබද්ධව ක්‍රියාත්මක වේ. වසරකට නීතිඥවරුන් වශයෙන් දිවුරුම් දෙන ආධුනික නීතිඥයින් පුහුණු කිරීම මෙහි අරමුණ වේ. **මෙම වසරේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ දී එක් කණ්ඩායම් වශයෙන් ආධුනික නීතිඥවරුන්** පුහුණු කොට ඇති අතර ඒ සඳහා ජ්‍යෙෂ්ඨ ප්‍රවීණ විද්වත් ජනාධිපති නීතිඥවරුන් ඇතුළු සම්පත් දායකයින්ගේ බාහිර සේවය කොමිෂන් සභාව විසින් ලබා ගෙන තිබේ.

II. නොවිධිමත් නීති අධ්‍යාපන වැඩසටහන

මහජනතාවට නීතිය පිළිබඳව අධ්‍යාපනය ලබා දීම සඳහා පාඨමාලවක් වශයෙන් සිදු කර ඇති වැඩසටහනකි. මෙහි දී විවිධ වයස් මට්ටම් වල විවිධ ක්ෂේත්‍ර වල නිරත වන මහජනතාවට මාස 04 ක අධ්‍යයන පාඨමාලවක් අධ්‍යයනයෙන් අනතුරුව විභාගයක් පවත්වා සහතික පත්‍රයක් ප්‍රධානය කිරීම සිදු කරනු ලැබේ. **මෙම වසර තුළ දී 25 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් වෙනුවෙන් මෙම නීති අධ්‍යාපන පාඨමාලාව පවත්වා ඇත.**

C.5. නාගරික පැල්පත් වාසීන් අරමුණු කොට සිදු කරනු ලැබූ වැඩසටහන්.

නාගරික සංවර්ධන අධිකාරිය විසින් සිදු කරනු ලබන ව්‍යාපෘතිය හේතුවෙන් කොළඹ නාගරික ජනතාවගේ නිවාස හා දේපළ රජයට අත්පත් කර ගැනීමටත් ඒ වෙනුවෙන් වන්දි ලබා දීම සිදු කරන අවස්ථාවන්හි දී තමාගේ අයිතිවාසිකම් පිළිබඳ පැහැදිලි සාක්ෂි ඉදිරිපත් කිරීමට

නොහැකි වූ ප්‍රජාව වෙනුවෙන් ගරු අධිකරණයේ නඩු කටයුතු පවරා රජයේ වන්දි ලබා ගැනීමට අවශ්‍ය දැනුවත් කිරීම වෙනුවෙන් මෙම වැඩසටහන් සිදු කරනු ලැබේ.

C.6. තොරතුරු දැන ගැනීමේ පනත යටතේ සිදු කරනු ලැබූ වැඩසටහන්.

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනතේ 23(1) (අ) වගන්තිය ප්‍රකාරව පනත ක්‍රියාත්මක වීම ආරම්භ වී මාස 03 ක් ඇතුලත සියලුම රජයේ ආයතන විසින් සිය ආයතනය තුල තොරතුරු නිලධාරියෙක් සහ අභියාචනා නිලධාරියෙක් පත් කළ යුතු විය. ඒ අනුව නීති ආධාර කොමිෂන් සභාවේ පහත නම් සඳහන් නිළධාරීන් තොරතුරු නිලධාරි සහ අභියාචනා නිලධාරි වශයෙන් පත් කරන ලදී.

නීතීඥ තාමරශී වික්‍රමනායක මිය - තොරතුරු නිලධාරී ලෙසද

නීතීඥ කෞශල්‍යා හපුආරච්චි මිය - අභියාචනා නිලධාරී ලෙසද පත් කරන ලදී.

C.7. සමෘද්ධිලාභීන් වෙනුවෙන් කරනු ලබන වැඩසටහන.

නීති ආධාර කොමිෂන් සභාව හා සමෘද්ධි දෙපාර්තමේන්තුව ඒකාබද්ධව නීති ගැටළු ඇති සමෘද්ධිලාභීන්ගේ දත්ත එක්රැස් කරමින් (Data Base) දත්ත පද්ධතියක් නිර්මාණය කර ඇති අතර එමඟින් සමෘද්ධිලාභී අඩු ආදායම්ලාභී ජනතාවට ඇති නීතිමය ගැටළු සඳහා කඩිනම් නීති උපදේශන සේවාවක් හා නඩු කටයුතු සම්බන්ධයෙන් මූලිකත්වය ලබා දී නොමිලේ ඔවුන්ගේ නීතිමය ගැටළු විසඳාලීමට හා යුක්තිය පසඳලීමට වැඩපිළිවෙලක් සකස් කොට ඇත.

1.2.3 2021 වර්ෂයේ ඒකාබද්ධ අරමුදල මඟින් ආයතනික මට්ටමින් වැඩසටහන් මෙහයවීම විශ්ලේෂණාත්මකව

අනු අංකය	මධ්‍යස්ථානය	දිනය	පැවැත්වූ ස්ථානය හා වැඩසටහන	සහභාගී වූ සංඛ්‍යාව	වියදම
01	නිකවැරටිය	2021.02.06	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, නිකවැරටිය. බහුකාර්ය සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීම	32	22,414.50
02	බද්දේගම	2021.02.07	සඟස සමිතිය, අම්පේගම බද්දේගම - කාන්තාවන් දැනුවත් කිරීම	60	25,000.00
		2021.02.16	ශ්‍රී සරණංකර මධ්‍යස්ථානය, ශිෂ්‍යයින් දැනුවත් කිරීම	60	25,000.00
03	මුත්තූර්	2021.03.09	ප්‍රජාශාලාව, පලත්තඩ්වෙනෙයි - කාන්තැවන් දැනුවත් කිරීම	50	22,900.00
04	යාපනය	2021.02.13	ප්‍රජා ශාලාව, කුරුණෑගල - මහජනතාව දැනුවත් කිරීම	30	26,578.24
05	මල්ලාකම්	2021.02.24	මානිපේ ලේඩිස් කොලේජ්, මානිපේ - ළමුන් හා ගුරුවන් දැනුවත් කිරීම	65	30,000.00
06	මාතර	2021.02.02	රජයේ නිලධාරීන් දැනුවත් කිරීම, දික්වැල්ල	165	37,422.00
		2021.02.24	රජයේ නිලධාරීන් දැනුවත් කිරීම, නිහගොඩ	146	26,881.00
07	අවිස්සාවේල්ල	2021.02.18	9 ශ්‍රේණියේ පාසැල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහ	65	15,125.00

1.2.4 ආරාධිත වැඩසටහන් සඳහා නීති ආධාර කොමිෂන් සභාවේ සහභාගීත්වය

